මොරවැව ප්‍රාදේශීය සභාව

-----------------------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 19 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 24 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක ණය ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු. 639,453 ක් වූ සේවක ණය ශේෂය රු. 326,493 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සේවක ණය රු. 312,960 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සභාව විසින් පසුගිය වර්ෂවල දී දෙන ලද අත්තිකාරම් නිරවුල් කර තිබුණත්, නොපියවූ අත්තිකාර් ලෙස රු. 221,981 ක සෘණ ශේෂයක් 2012 වර්ෂයේ සිට ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඇ) සභාව සතු ස්ථිර තැන්පත්වල කරන ලද ආයෝජන කිසිවක් නොමැති නමුත් රු. 195,838 ක් සෘණ ශේෂයක් ලෙස ශේෂ පත්‍රයේ 2012 වර්ෂයේ සිට දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු රු. 2,491,400 ක උසාවි දඩ වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ රු. 7,226,850 ක් ලෙස දක්වා ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 4,735,450 ක් වැඩියෙන් පෙන්වා ඇත.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට ලැබුණු රු. 6,390,000 ක කැබ් රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2013 සහ 2014 වර්ෂවලදී JCB යන්ත්‍රය කුලියට දීමෙන් ලැබිය යුතු එකතුව රු. 93,400 ක් වූ ආදායම ගිණුමගත කර නොතිබුණි.

1.3.2 අවිනිශ්චිත ගිණුම

---------------------

2011 වර්ෂයේ සිට පැවත එන රු. 7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

-----------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.49,991,963 ක වටිනාකම වූ ගිණුම් විෂයයන් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.

------------------------------------------------

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 10 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබීම. |

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,255,867 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,652,482 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

-----------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 323 | 25 | - |
| බදු කුලී | 1,090 | 629 | 46 |
| බලපත්‍ර ගාස්තු | 238 | 176 | - |
| වෙනත් ආදායම් | 4,830 | 4,430 | - |

2.2.2 උසාවි දඩ

-------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 සහ 2014 වර්ෂයන් සඳහා උසාවි දඩ වශයෙන් ලැබිය යුතු රු. 5,178,334 ක් ලබා ගැනීමට විගණිත දිනය වූ 2015 අගෝස්තු 11 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන්ට අනුව භාණ්ඩ වර්ග 06 ක් අළුත්වැඩියා කිරීමටත්, භාණ්ඩ වර්ග 19 ක් ඉවත් කිරීමටත්, භාණ්ඩ වර්ග 33 ක් විනාශ කිරීමටත් 2015 අගෝස්තු 11 දින වන විටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) JCB යන්ත්‍රයයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාසික වාරික 60 කින් ගෙවා නිම කිරීමට 2013 මැයි මස ලබාගත් රු. 9,520,000 ක ණය මුදල වෙනුවෙන් 2015 ජූලි 30 දින වන විට ගෙවිය යුතු ණය මුදල හා පොලිය රු. 3,952,391 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අනතුරකින් දැඩි ලෙස අලාභහානි වී ඉවත් කර තිබූ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ කැබ් රථයක් රු. මිලියන 1.7 මුදලක් වියදම් කර සභාව විසින් 2012 මැයි 21 දින අළුත්වැඩියා කර භාවිතා කරනු ලැබුවද, එය සභාවට පවරා ගැනීමට විගණිත දිනය වූ 2015 අගෝස්තු 11 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 පෙබරවාරි 15 දින රු. 237,100 ක WiFi අන්තර්ජාල පහසුකම සඳහා ගෙවා තිබුණද, ඒ සඳහා සන්නිවේදන සම්බන්ධතා ලබා දී නොතිබුණි. මේ වන විට රවුටරයක් මඟින් අන්තර්ජාල පහසුකම ලබාගෙන ඇති බැවින් අන්තර්ජාල පහසුකම සඳහා දැරූ වියදම නිශ්කාර්ය වියදමකි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

3.2.1 ඇතාබැඳිවැව ප්‍රධාන මාර්ග ඉදිකිරීම

----------------------------------------

මෙම මාර්ගයේ කි.මී. 2 ක් ගල් අතුරා තාර දමා ඉදිකිරීම සඳහා රු. 18,046,600 (එකතු කළ අගය මත බදු රහිත) ක වටිනාකමකට මාස තුනක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 මැයි 31 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) මෙම මාර්ගයේ ඉදිකිරීම් කාර්යය සාධනය සතුටුදායක මට්ටමක නොතිබීම හේතුවෙන් 2012 ඔක්තම්බර් 08 දින වන විට රු. 2,954,923 ක් ගෙවීමෙන් පසුව කොන්ත්‍රාත්තුව නවතා දමා 2014 මාර්තු 13 දින රු. 19,577,095 ( එකතු කළ අගය මත බදු රහිත) ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කොන්ත්‍රාත්කරුවන් ඇගයීම් කර වඩා සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම නිසා රු. 4,485,418 ක් අතිරේකව ගෙවීම් කිරීමටත්, නියමිත කාලය තුල ඉදිකිරීම් සම්පූර්ණ නොකිරීමටත් සිදු වී තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් සතුටුදායකව සිදු නොකරන අවස්ථාවේ දී කාර්යය සාධන බැඳුම්කරයේ කාලය අවසන් වීමට පෙර කාර්යය සාධන බැඳුම්කරය මුදල් කර නොගැනීම නිසා එහි වටිනාකම වූ රු. 902,330 ක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) මෙම මාර්ගය ඉදිකිරීමේ දී 1+250 සිට 1+450 අතර ස්ථාන කිහිපයක කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියට නොතිබීම සහ කොන්ක්‍රීට් ඝනකම අඟල් 6 ට වඩා අඩුවෙන් තිබීම මත එම ස්ථානයන්ට යෙදූ කොන්ක්‍රීට් 30 $m^3$ ප්‍රමාණයෙහි දිගු කාලීන පැවැත්මට ගැටළුවක් සිදු වී තිබූ බව 2015 අගෝස්තු 11 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) 2007 අංක 13 හා අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් සංශෝධිත 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 19,265,499 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 48,164 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.2.2 ප්‍රාදේශීය සභා සඳහා පුස්තකාලයක් ඉදිකිරීම

-----------------------------------------------------

දැයට කිරුළ වැඩසටහන මඟින් පුස්තකාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහළය ඉදිකිරීම සඳහා රු. 7,048,316 (එකතු කළ අගය මත බදු රහිත) ක වටිනාකමකට මාස තුනක කාලයක් තුල ඉදිකරීම් අවසන් කිරීමේ පදනම මත 2013 ජනවාරි 22 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහළය ඉදිකිරීම සඳහා අනුමත සැළැස්මට අනුව කොන්ක්‍රීට් කණු 21 ක් සඳහා එක් කණුවකට 16 mm යකඩ කම්බි 04 ක් සහ 12 mm යකඩ කම්බි 04 බැගින් යෙදිය යුතු වුවද, එක් කණුවකට 16 mm කම්බි 04 ක් හා 12 mm කම්බි 02 ක බැගින් යොදා කොන්ක්‍රීට් කණු 21 ක් ඉදිකර තිබුණි. ඒ අනුව කොන්ක්‍රීට් කණු සඳහා යකඩ කම්බි 77 ක් අඩුවෙන් යොදා ගැනීමෙන් ගොඩනැගිල්ලේ දිගු කාලීන පැවැත්මට ගැටළුවක් වී තිබුණි.

(ආ) පුස්තකාලය සඳහා නාම පුවරුවක් සවි කිරීස වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 18,000 ක් ගෙවා තිබුණු නමුත් එය සවිකර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

--------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | 01 | - |
| ද්විතික මට්ටම | 14 | 06 | 08 |
| තෘතීය මට්ටම | 16 | 14 | 02 |
| එකතුව | 31 | 21 | 10 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 අප්‍රේල් මස සිට පුරප්පාඩු පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට 2015 අගෝස්තු 11 වන විටද කටයුතු කර නොතිබුණු අතර, වැඩබැලීමේ පදනම මත ලේකම්වරයකු පත්කර තිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, සංවර්ධන නිලධාරී, රියදුරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) මානව සම්පත් කලමනාකරණය